**ශීර්ෂය 428 මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි මස 11 දින ගණන්දීමේ නිලධාරි නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි මස 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේ ස්ථාපිත වී ඇති බැවින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අදාලව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ට අනුව අක්මුදල් ගැලපීමේ ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | වෙනත් රාජ්‍ය ආයතන වැය විෂයයන් යටතේ ලද ප්‍රතිපාදන අනුව කළ වියදම් මූල්‍ය ප්‍රකාශන වල මු.රෙ. 208 යටතේ සටහන් නොකිරීම මත අක්මුදල් ගැලපීමේ ගිණුමක් සෑදීමට අවශ්‍ය තොරතුරු නොතිබු හෙයින් අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කිරීමක් සිදු නොවීය. | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කිරීමට කටයුතු කල යුතු වේ. |

**1.6.2** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**(අ)** **පුනරාවර්තන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | වියදම් විෂයයන් 16 ක භාණ්ඩාගාර මුද්‍රිත අනුව වියදම් සාරාංශය හා මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් වියදම් ප්‍රකාශය අතර රු.836,404 ක වෙනසක් නිරීක්ෂණය විය. | වැය ශීර්ෂ 118 මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය 2020 අගෝස්තු 31 දක්වා ක්‍රියාත්මක වූ අතර 2020 සැප්තැම්බර් 01 දින සිට නව අමාත්‍යාංශ ප්‍රතිස්ථාපනය කර තිබුණි. මහවැලි කලාප ආශ්‍රිත පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ (428) වියදම් වලට | වෙනස්කම්වලට හේතුන් සොයා නිවැරදි කිරීමට පියවර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිපාදන ලබා දී තිබුණේ 160 වැය ශීර්ෂය යටතේය. නව වැය ශීර්ෂ අංක 428 යටතේ ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2020 අගෝස්තු 31 දින දක්වා මෙම අමාත්‍යාංශය පොදුවේ දරා ඇති වියදමට නව අමාත්‍යාංශයේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනය එකතු කර භාණ්ඩාගාරයේ CIGAS වැඩසටහන වෙත ලබා දී ඇත. මෙම ප්‍රතිපාදනය එකතුව ආසන්න අගයට ගෙන ඇති නිසා මෙසේ ඉලක්කම් අතර වෙනසක් පෙන්නුම් කෙරේ. | |
| **(ii)** | මූල්‍ය ප්‍රකාශන සමඟ වූ වැඩසටහන් වියදම් ප්‍රකාශය අනුව වියදම රු.14,742,399 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත වියදම් සාරාංශය අනුව එය රු.13,973,388 ක් වූයෙන් රු.769,011 ක වෙනසක් නිරීක්ෂණය විය**.** | 428-1-2-1003 යටතේ දක්වා ඇති රු.418,064 ක වියදම උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා 130-1-14-0-1003 වැය විෂය යටතේ කළ වියදමක් වන අතර 428-1-2-1409 යටතේ දක්වා ඇති රු.350,947 ක මුදල මැතිවරණ කාර්යාලයේ වැය විෂය අංක 020-1-1-4-1409 යටතේ සටහන් වූ මාරු පත්‍ර අගය වේ. මෙම වියදම් මූල්‍ය ප්‍රකාශන වල මු.රෙ. 208 යටතේ වාර්තා කළ යුතු වුවද අත් වැරදීමකින් 428 යටතේ වාර්තා කර ඇති නිසා මෙම වෙනස ලැබී ඇත. | නිවැරදිව ගිණුම් තැබීම කල යුතු වේ. |

**(ආ) මූලධන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයෙහි වෙනත් වැය විෂයය සඳහා මුළු වියදම රු.1,562,892 ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිත වියදම් සාරාංශය අනුව එම වැය විෂයය සඳහා කිසිදු වියදමක් පෙන්නුම් නොකළ බැවින් රු.1,562,892 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වියදම 425 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ලද ප්‍රතිපාදනයක් බැවින් එය 425 වාරිමාර්ග අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මුද්‍රිත වියදම් සාරාංශයෙහි සටහන් වේ. එම වියදම ද මු.රෙ. 208 යටතේ සටහන් කළ යුතු වුවද අත්වැරදීමකින් 428 යටතේ වාර්තා කර ඇති නිසා මෙම වෙනස ලැබී ඇත. | නිවැරදිව ගිණුම් තැබීම කල යුතු වීම. |

## 1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 අනුව තවදුරටත් වාර්තා කළයුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු විය. එසේ වුවද 2020 දෙසැම්බර් 18 දින හා 2020 දෙසැම්බර් 22 දින වාරිමාර්ග අමාත්‍යාංශයෙන් ලද වාහන 10 ක් නිසි පරිදි පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සටහන් කර ගත් අතර මෙම වාහන දහය කඩිනමින් පවරා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| (ආ) | මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 428 ට අදාල ස්ථාවර වත්කම් සම්බන්ධ තොරතුරු **"සිගාස්"** මෘදුකාංගයට ඇතුළත් කර නොතිබුණි. | පෙර පැවති පරිසර අමාත්‍යාංශය (160) යටතේ ස්ථාවර වත්කම් ගිණුම් ගත කර ඇති අතර එම වත්කම් මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට මෙතෙක් පවරා නොමැත. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමෙන් පසු ශීර්ෂ 428 යටතේ වාර්තා කළ යුතු වත්කම් CIGAS වැඩසටහනට වාර්තා කිරීමට කටයුතු කරමු. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතු වේ. |

1.6.4 **තැන්පතු**

**---------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ------------------------------------ | ------------ |
| අංක 6000-0-0-013-0-174-0 දරන ගිණුමේ ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙන ඇති රු.66,414 ක් වූ ශේෂ 05 ක් වර්ෂ 02 ක් ඉක්මවා තිබුණද, මුදල් රෙගුලාසි 570 (ඇ) සහ 571 (3) පරිදි රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. තව ද පොදු තැන්පත් ගිණුමේ ශේෂ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති කාල විශ්ලේෂණය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ සමස්ත ලෝකයටම බලපෑ කොවිඩ් 19 හදිසි වසංගත තත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවේද සමස්ත රාජ්‍ය ආයතන වල සේවකයන්ගේ පැමිණීම සියයට 50 කට සීමා වූ නිසා රාජ්‍ය ආයතන වල කටයුතු ද සීමා කිරීමට සිදු විය. එමෙන්ම 2020 වර්ෂයේ අගෝස්තු මස මැතිවරණයෙන් පසු නව අමාත්‍යාංශ ස්ථාපනය වීමත් සමඟම ගිණුම් අංශයේ සේවක සංඛ්‍යාව නිලධාරීන් 03 දෙනෙකුට පමණක් සීමා විය. මෙවැනි හේතු නිසා 6000–0–0-013-0-174-0 දරන ගිණුමේ ආරම්භක ශේෂයේ අවු. 2 – 5 ත් ඉක්ම වූ රු.66,414 ක මුදල රජයේ ආදායමට බැර කර නොතිබූ බව පිළිගන්නා අතර එය 2021 මාර්තු මස ගිණුම් සාරාංශ මගින් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල බව කාරුණිකව දන්වා සිටිමි. ඉදිරියේදී මාස 06 ඉක්මවන විටම අදාල ශේෂයන් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් තැබීම කල යුතු වීම. |

**1.6.5 විගණන සාක්ෂි නොවීම**

**--------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ---------------------------------------- | ----------- |
| මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාවය පැහැදිලි කරන වියදම් සාරාංශය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 428-1-2-1409 වැය විෂයයෙන් මු.රෙ. 66 යටතේ 428-1-2-1506 ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත වැය විෂයය අතර ප්‍රතිපාදන මාරු කිරීමක් සිදු කොට ඇත. අමාත්‍යාංශයට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ දේපල ණය පොළී වැඩි වීම නිසා | නිවැරදිව අදාල තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |

එම ප්‍රතිපාදනයන් ඉක්මවා යාමක් සිදුව ඇත. එම සටහන ACA-2(i) හි දක්වා ඇති අතර ACC-2(iii) මූලික හා සංශෝධිත ගිණුම් ඇස්තමේන්තු අතර විචලතාව පැහැදිලි කරන ගිණුම් සාරාංශය මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් නොකිරීම අතපසුවීමක් බව පිළිගනිමි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

--------------------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩසටහන 01 යටතේ වැය විෂයයන් 06 ක් සහ වැඩසටහන 02 යටතේ වූ එක් වැය විෂයයක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.2,100,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | රටේ පවත්නා වසංගත තත්ත්වය හේතුවෙන් වියදම් සීමා වීම, සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුල ගොඩනැගිලි අලුත්වැඩියා සීමා වීම, ප්‍රතිපූර්ණය කිරීම සඳහා බිල්පත් නොලැබීම ආදී හේතූන් නිසා ඉතිරි වීම් සිදු වී තිබුණි. | ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර නිවැරදිව සැලසුම් කල යුතු වේ. |
| (ආ) | වැඩසටහන 01 යටතේ වැය විෂයයන් 10 ක සියයට 30 සිට සියයට 93 දක්වා වූ පරාසයක ඉතිරියක් හා වැඩසටහන 02 යටතේ වූ වැය විෂයයන් 05 ක සියයට 25 සිට සියයට 97 දක්වා වූ පරාසයක ඉතිරියක් පැවතුණි. | පිළිගෙන ඇත. | -එම- |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 30 දින වාහනයක් සඳහා රු. 205,568 ක් වැය කර ටයර් මිලදී ගෙන තිබුණද ඒ සඳහා වූ බැරකම වර්ෂයේ බැරකම් යටතේ වාර්තා නොකර 2021 පෙබරවාරි 25 දින වවුචර් අංක 83 මගින් පියවා තිබුණි. | එම වියදම අතපසුවීමකින් බැදීම් හා බැරකම් ලේඛණයේ පිටපත් කර නොමැති අතර එවැනි දේ නැවත සිදුනොවීමට වග බලා ගන්නා ලෙස විෂයය ලිපිකරුට උපදෙස් ලබා දී ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය සඳහා විගණක තනතුරක් අනුමත වී ඇති අතර කිහිපවිටක දී රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිපි මගින් දැනුම් දුන්න ද මේ වන විටත් එම තනතුර පුරප්පාඩුව පවතී. මේ සම්බන්ධයෙන් රාජකාරි ආවරණය කරන අතර වාරිමාර්ග අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන විගණන කමිටු රැස්වීම මගින් මෙම අමාතාංශයේ රාජකාරි ද ආවරණය කරගනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි අංක 429 | 2020 මුදල් වර්ෂයේ ගිණුම් පොත් 2020 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි සහ ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වැය ලෙජර පියවීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ් 19 හදිසි වසංගත තත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවේද සමස්ත රාජ්‍ය ආයතන වල සේවකයන්ගේ පැමිණීම සියයට 50 කට සීමා වීම, 2020 අගෝස්තු මැතිවරණයෙන් පසු ගිණුම් අංශයේ සේවක සංඛ්‍යාව 03 කට සීමා වීම, වැය ලෙජර සඳහා විෂයය ලිපිකරුවෙකු නොමැති වීම මේ සඳහා හේතු වී ඇත. ඉදිරියට නිවැරදි ලෙස වැය ලේජර පියවීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු දැනටමත් ආරම්භ කොට ඇති අතර හැකි ඉක්මනින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16(2) වගන්තිය | විගණකාධිපති වෙත ඉදිරිපත් කරන වාර්ෂික ගිණුම් සමඟ ඉදිරිපත් කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021 අප්‍රේල් 05 දින වනවිටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම දැනට ආරම්භ කොට ඇත. හැකි ඉක්මනින් සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අතුරු අග්‍රිමය නැවත පියවියයුතු වුවත්, අවස්ථා 13 කදී දින 12 සිට දින 173 දක්වා වූ කාලපරාසයක අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය විය. | සංග්‍රහ කටයුතු සඳහා ලබා දී ඇති අත්තිකාරම් වර්ෂය සඳහාම ලබා දී ඇති අතර එම අත්තිකාරම් මුදල් මාසිකව ප්‍රතිපූර්ණය නොකරයි. තවද අමාත්‍යාංශය රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් හා වාරිමාර්ග අමාත්‍යාංශය ලෙස අංශ තුනකට වෙන්කර නිලධාරීන් එක් එක් අංශ වෙත යොමු කරන ලද බැවින් හා කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නිලධාරීන්ගේ පැමිනීම සීමා කල බැවින් එම නිලධාරීන් මඟින් මෙම අත්තිකාරම් පියවා ගැනීම ප්‍රමාද විය. | කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(2)(ඇ) ප්‍රකාර අතුරු අග්‍රිම ලබාදීම මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සිදුකළයුතු වුවද, අවස්ථා 9 කදී මාණ්ඩලික නොවන නිලධාරීන්ට රු.95,728 ක් අතුරු අග්‍රිම ලෙස ලබාදී තිබුණි. | මෙම අමාත්‍යාංශය යටතේ ප්‍රමාණවත් මාණ්ඩලික නිලධාරීන් ප්‍රමාණයක් නොසිටි අතර ලේකම්තුමාගේ අනුමැතිය ලබාගෙන ඒ වන විට කාර්ය මණ්ඩලයේ සිටි සුදුසු නිලධාරීන් වෙත එම අත්තිකාරම් ලබා දීමට කටයුතු කරන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.6 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද "ගෝලීය දේශගුණය හා කාලගුණ විපර්යාසයන්ට සාර්ථක ලෙස මුහුණදීම පිණිස ඒකාබද්ධ ජල දහරා සහ ජල සම්පත් කළමනාකරණය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය" 2020 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගෙන එහි වියදම් පොදු තැන්පත් ගිණුම හරහා සිදුකර තිබුණි. එහෙත් එම වියදම් පොදු තැන්පත් ගිණුම මඟින් දැරීමට අදාලව ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැවරිය යුතු වුවද පැවති වසංගත තත්වය මත සේවකයින්ගේ පැමිණීම සියයට 50 කට සීමා වූ නිසා ශේෂ පැවරීම ප්‍රමාද වූ අතර ප්‍රධාන මූල්‍ය නිලධාරි සමග දුරකථනයෙන් සාකච්ඡා කර ගත් පරිදි මෙම අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම මඟින් ඉදිරි ගනුදෙනු සිදු කිරීමට එකඟ වූ අතර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවද ඊට එකඟ විය. තවද මේ වන විට තැන්පත් ගිණුමේ අදාල ව්‍යාපෘතිය සඳහා කරන ලද ගෙවීම් අවසන් වෙමින් පැවති අතර තවදුරටත් ගෙවීම් කිරීමට ඉතිරිව තිබුණේ වවුචර් පත් 08 කට පමණි. | වියදම් දැරීමේ දී විධිමත් ලිඛිත අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

පසුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අංක NPD/PPPF/IWWRMP හා 2020/10/14 දිනැති ලිපියෙන් 2020 නොවැම්බර් අග වන විට ව්‍යාපෘතියේ ගෙවීම් කටයුතු අවසන් කළ යුතු බව දන්වා ඇති අතර නැවත ඉහත අංක දරන 2020.11.27 දිනැති ලිපියෙන් 2020.12.10 දින වන විට ව්‍යාපෘතියේ සියලු ගෙවීම් කටයුතු අවසන් කර ඉතිරි මුදල් ශේෂය ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙස දක්වා ඇත. ඒ අනුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව දුරකථනයෙන් ලද වාචික උපදෙස් මත හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගෙන් ලද වාචික උපදෙස් මත ව්‍යාපෘතියේ අවසන් කටයුතු මෙම අමාත්‍යාංශය මඟින්ම සිදු කිරීමට තීරණය කරන ලද අතර 2020.12.10 ව්‍යාපෘතියේ අවසන් මුදල් ශේෂය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට ලබා දී කටයුතු නිම කර ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය හා පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය 2020 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන නව අමාත්‍යාංශයක් බැවින් වාර්තා කිරීමට පාඩු හා අත්හැරීම් නොමැති වීම මත පාඩු හා අත්හැරීම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැත. ඒවා නොමැති බව දන්වා මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකිරීම අතපසුවීමක් බව පිළිගනිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරු 09 ක් ද්විතීය මට්ටමේ තනතුරු 13 ක් ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් පුරප්පාඩුව පැවති අතර එක් තනතුරක අතිරික්තයක් විය. | සමාලෝචිත වර්ෂයේ අවසානයට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් කිහිප වතාවකදීම රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. උපාධිධාරී අභ්‍යාසලාභීන් මඟින් කළමනාකරණ සේවා නිලධාරී සහ සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු කළමනාකරණය කරගනු ලබයි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමතකල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාමට කටයුතු කල යුතුය. |